**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍යා ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍යා ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍යා ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍යා ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍යා ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-------------------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශන වල නොදැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට තිබුණු මුදල් ශේෂයෙන් රු 10,329,730 ක බැංකු අයිරාව හිලව් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි . | ගිණුම් පොත් අනුව ඍන අගයක් පැවතියද බැංකු ගිණුම් අනුව අයිරාවක් නොමැත.ගිණුම් කළඹ (Pooling)සංකල්පය අනුව සියලු ගිණුම් එකිනෙක සම්බන්ධ කර ඇති බැවින් සමස්ත ගිණුම් වල වටිනාකම අයිරා තත්වයක් නොපෙන්වයි. අරමුදල් කළමනාකරණ ගිණුම තුලින් අනෙකුත් මුදල් පොත් වල ඇති හිගය පියවී යන බැවින් න්‍යායාත්මකව අයිරා තත්වයක් නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව කටයුතු කල යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංචාරක පොලිස් ඒකකයෙන් ලැබිය යුතු රු 3,192,000 ක කුලී ආදායමක් 2014 දී ආදායම් ලෙස හඳුනාගෙන ලැබිය යුතු ණයගැතියන් යටතේ දක්වා තිබුණද ,මෙකී මුදල අය කර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින නමුත් ,ඒ සඳහා වන හානිකරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. 2022 ගිණුම් වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල නිසි ගැලපීම් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ)රු.3,923,058 ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වූ භෞතිකව සත්‍යාපනය කල තොගය තොග ලේඛන සමග සසඳා විචලනයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. රු. 83,540 ක් වටිනා මත්පැන් තොගයක් ගිණුම් වල දැක්වූ නමුත් එය භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | තොග ලැබීම හා නිකුත් කිරීම් සංඛ්‍යාව අති විශාල බැවින් නිවැරදිතාව පවත්වා ගැනීමට ගබඩා පාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කර ඇති අතර 2022 වසරේ සිට අදාල සැසඳීම් නිවැරදිව සිදුකිරීමට කටයුතු කරනු ඇත. 2022 ගිණුම් වර්ෂයේදීරු.83540.ක් වූ මත්පැන් තොගය ජාතික විගණන කාර්යාලීය නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සත්‍යාපනය කරන ලදී. | භෞතිකව සත්‍යාපනය කල තොගය තොග ලේඛන සමග සසඳා විචලනයන් හඳුනාගැනීමට කටයුතු කල යුතු වීම. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූලා ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල් | 5,774,778 | 6,512,810 | 738,032 | එකඟ වේ .2022 ගිණුම් වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු ගිණුම්වල ගැලපීමට කටයුතු කල යුතුය. |
| (ආ) සංචාරක සංවර්ධන බදු ආදායම | 88,207,035 | 97,916,463 | 9,709,428 | එකඟ වේ .2022 ගිණුම් වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු ගිණුම්වල ගැලපීමට කටයුතු කලයුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු22,756,021. ක් වූ අතර 2022 මැයි 31දින වන විට ද එකදු ණයගැතියෙක්ගෙන් හෝ ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි. තවද එම ණයගැතියන්ගෙන් එකතුව රු18,375,051. ක් වසර 05කට වඩා හිඟව පැවති අතර එය මුළු වෙළඳ ණයගැතියන්ගේ සියයට 81 ක් විය . | එකඟ වේ .2022 ගිණුම් වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කලයුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ලෙස රු 1,452,439 .ක් 2014වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණු නමුත් එම බදු මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | එකඟ වේ .2022 ගිණුම් වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | බදු මුදල් කාලීනව නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය<br>-------------------------<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට වටිනාකම රු. 301,720,753 ක් වූ දිගුකාලීන ආයෝජන සහ රු. 135,000,000 ක් වූ කෙටිකාලීන ආයෝජන ආයතනය සතුව පැවතුන ද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 436,720,753 | එකඟ වේ. 2022 ගිණුම් වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | මුදල් පනතට අනුව කටයුතු කල යුතු වීම. |
| (ආ) 2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී03/ 2018 හා 2021 දෙසැම්බර් 15 දිනැති අංක පීඊඩී03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>-----------------------<br>2021 මූල්‍ය වර්ෂය තුළදී අලාභ තත්වයක් වාර්තා කර ඇති එහෙත් 2020 වර්ෂයට සාපේක්ෂව එම | 2,493,000 | එකඟ වේ .2021 වර්ෂයේදී සේවකයන් හට තිබූ ආර්ථික අපහසුතා පිලිබඳවත්, සේවක සංගමයේ ඉල්ලීම් හා ආයතනයේ මෙහෙයුම් වර්ධනයත්(සිසුන් බඳවා ගැනීම හා පුහුණුව අවසන් කිරීම), සලකා අධ්‍යක්ෂක මණ්ඩලය මගින් එම මුදල දීමට තීරණය කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| අලාභදායී බව අඩු කරගෙන ඇති ආයතනයක සේවකයන්හට රු.5000 ක ප්‍රසාද දීමනාවක් පමණක් ගෙවිය හැකි නමුත් සමාලෝචිත වර්ෂය තුලදී එක් සේවකයකුට රු. 13,500 බැගින් වූ රු. 2,493,000 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | | | |
| (ඈ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>------------------------<br>තත්කාර්යය අතුරු අග්‍රිමය එය ලබාදුන් කාර්යය අවසන් කර දින 10ක් තුල පියවිය යුතු වුවද අවස්ථා 11 කදි ලබාදී තිබුණු රු5.42,075ක තත්කාර්යය අතුරු අග්‍රිම පියවීම සඳහා දින 21ක සිට දින 251ක් දක්වා අතර කාලයක් ප්‍රමාද වී තිබුණි. | 542,075 | තත්කාර්ය අතුරු අග්‍රිම දත්ත ඇතුලත් කරන ලේඛනයෙහි දෙසැම්බර් මස 03 (12/3) වෙනුවට මාර්තු මස 12(3/12) ලෙස දිනය සටහන් වීම මෙයට හේතු වී ඇත .ඒ හැරුණු කොට සියලුම අත්තිකාරම් ලබාදීම් නිසි ලෙස පියවා ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය<br>---------------------<br>යොමුගත වගන්ති ප්‍රකාරව රු.250,000 ක් ඉක්මවන වැඩ සඳහා වූ කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදි ක්‍රියාත්මක කල රු.15,261,207 ක වැඩ කොන්ත්‍රාත් 7ක් සඳහා විධිමත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | 15,261,207 | එකඟ වේ .අදාළ මානව සම්පත් නීති නිලධාරී, සහකාර අධ්‍යක්ෂක ප්‍රසම්පාදන හිඟකම හේතුවෙන් මෙය සිදු කිරීමට මහ හැරී ඇති නමුත් ඉදිරියේදී අදාළ වගන්ති ප්‍රකාරව කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කලයුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.182,359,902 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 229,308,580ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 46,948,678 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංචාරක සංවර්ධන බදු ආදායම සහ පාසල් ගාස්තු ආදායම් වැඩිවීම සහ අනෙකුත් වියදම් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

-------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 දී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට රු3,771,216 . ක් දරා තිබුණද, ආයතනයේ අවශ්‍යතාවයන් සමග නොගැළපීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේදී එය අසාර්ථක වී තිබුණි . කෙසේ වුවද එම වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත්කර නොතිබුණි. | එකඟ වේ .2022 ගිණුම් වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | ආයතනයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන කටයුතු කලයුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011දී ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් වාහනයක් ලැබී තිබුණද 2021 ,දෙසැම්බර් 31දින වන විටත් එම වාහනයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි . | වාහනය පවරා ගැනීමට අදාලව සංචාරක අමාත්‍යාංශය මගින් ඉදිරි කටයුතු කරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය තොරතුරු හා ලියවිලි අප විසින් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | වාහනය පවරා ගැනීමට කටයුතු කලයුතුය. |